## ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලය - 2013

ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 2005 අංක 32 දරන ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩල පනතේ iv කොටසේ 29(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 වගන්තියට අනුව ආදායම් හා වියදම් හිලව් කිරීම නොකළ යුතු වුවද වාර්ෂිකව පවත්වනු ලබන "ලෝක ප්‍රතීතන දින සැමරුම" සඳහා සමාලෝචිත වර්ෂයේදී අනුග්‍රාහකයන්ගෙන් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමෙන් ලද ආදායම් සහ දරන ලද වියදම් වෙන් වෙන්ව නොදක්වා එකිනෙකට හිලව් කොට රු. 750,980 ක ශුද්ධ අලාභයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මණ්ඩලය විසින් විදේශ විනිමය ගනුදෙනු සිදුකරන අතර 2012 වර්ෂයේදී රු.5,708 ක විදේශ විනිමය හුවමාරු අලාභයක් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. එහෙත්, 2013 වර්ෂයේදී පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති 1.11 යටතේ විදේශ විනිමය අනුපාතික වෙනස්වීම් වල බලපෑම ගිණුම්ගත කර නොමැති බවත් 2014 වර්ෂයේ සිට ගිණුම්ගත කරන බවත් දක්වා තිබුණි. මේ අනුව, මණ්ඩලය විසින් විදේශ විනිමය ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තියේ 6.5.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත 2013 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 වගන්තිය | සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමකින් තොරව පුහුණු වැඩසටහන් සඳහා එකම ආයතනයකින්ම ආහාරපාන ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,007,325 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (i) 8.3.3 වගන්තියේ (ඈ) ඡේදය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කාර්යසාධනය මත දිරිදීමනා ගෙවීම සඳහා රු.114,000 ක් හා ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු මත රු.447,091 ක දීමනාවක් ගෙවා තිබුණි. |
| | (ii) 9.14.2 වගන්තිය | භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් කාර්යාලීය අත්පොතක් 2013 ජූලි 01 දින නිකුත් කර තිබුණි. |
| ඇ) | 2010 ඔක්තෝම්බර් 11 දිනැති අංක MOFP O1/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය | විදේශ ගමන් සඳහා ගෙවීම් කිරීමේදී අනියම් වියදම් දීමනාව හා ඒකාබද්ධ දීමනාව වෙනුවට, විදේශගත වන දිනකට රු.7,500 බැගින් ගමන් ගාස්තු ද තක්සේරු ගාස්තු වශයෙන් එක් පුද්ගලයෙකුට සාක් රටවල්වලට හා අනෙකුත් රටවල්වලට පිළිවලින් රු.12,000 ක් හා රු.18,000 ක් බැගින් කළමනාකරණ මණ්ඩලය විසින් 2012 නොවැම්බර් 16 දින අනුමත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී විදේශ ගමන් සඳහා චක්‍රලේඛයට පටහැනිව රු.363,000 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.59,633 ක අතිරික්තයක් පෙන්නුම් කරන ලද අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු. 1,115,619 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 1,055,986ක අඩු වීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතීතනය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල විද්‍යුත් මාධ්‍ය වෙත ඉදිරිපත් කිරීම් 2 ක් හා මුද්‍රිත මාධ්‍ය සමඟ සාකච්ඡා 2 ක් සිදුකිරීමට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර තිබුණද එයින් එක් ඉදිරිපත් කිරීමක් හෝ සම්මුඛ සාකච්ඡාවක් හෝ සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රතීතනය සඳහා අයදුම්පත් එවීමේ මාර්ගගත පරිගණක පද්ධතිය (Online System) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.350,924 ක් වැය කර තිබුණ ද විගණිත දින වන විට ප්‍රතීතනය සඳහා එක් අයදුම් පත්‍රයක් හෝ මාර්ගගත පරිගණක පද්ධතිය ඔස්සේ ආයතනය වෙත ලැබී නොතිබුණි. ආයතනික වෙබ් අඩවිය තුල මෙම මාර්ගගත පද්ධතිය මගින් ප්‍රතීතනය සඳහා අයදුම්පත් ලබා ගැනීමේ හැකියාව පැහැදිලිව නොදැක්වීම මීට හේතු වී තිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව සහ රාජ්‍ය භාගය ලෙස කිසිඳු මුදලක් අයකර නොගෙන තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් සඳහා මණ්ඩලයේ නිලධාරීන් සම්පත් දායකයන් ලෙස යොදවාගෙන ප්‍රධාන දේශකවරුන් සහ සහායක නිලධාරීන් වශයෙන් පිළිවෙලින් රු.240,000 ක් හා රු.31,900 ක් ගෙවා තිබුණි.

(ආ) 2009 ජූනි 01 දිනැති අංක 34 (i) දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය හා මණ්ඩලය විසින් සම්පාදිත කාර්යාලීය අත්පොතේ 12.5 ඡේදය ප්‍රකාරව ගෙවිය යුතු සංයුක්ත දීමනාව රු.500 ක් වුවද එක් අයෙකුට රු.2,000 බැගින් නිලධාරීන් 8 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුලදී රු.35,600 ක් වැඩියෙන් ගෙවා තිබුණි. එම වැඩමුළු වලට සහභාගී වීම සඳහා ආයතනය මඟින් ප්‍රවාහන පහසුකම් සලසා තිබියදී කුලී පදනම මත ලබා ගත් වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය විසින් රු.229,952 ක ප්‍රවාහන වියදමක්ද දරා තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

2012 නොවැම්බර් 19 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ආයතනය වෙත ප්‍රථම වතාවට අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී තිබූ අතර, 2008 ඔක්තෝබර් 30 දින සිට වැඩ ආවරණය කිරීමේ පදනම මත පත් කර තිබූ නිලධාරියෙකු විගණිත දින වූ 2014 අප්‍රේල් 30 දින දක්වාම එම තනතුරේ රාජකාරී කටයුතු සිදුකර තිබුණි.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී සියයට 2 සිට සියයට 149 දක්වා විචලනයක් දක්නට ලැබීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වා සභාගත කර නොතිබුණි. 2011 වාර්ෂික වාර්තාව 2013 ජූලි 23 දින සභාගත කර තිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ) අයවැය පාලනය
ආ) කාර්ය මණ්ඩල පාලනය
ඇ) ගිණුම්කරණය
ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය